
Fail නොවන
F පන්තිය
ගීහංසි තිබ්බුටුමුනුව

# Fail නොවන

# F පන්තිය

ගීහංසි තිබ්බුටුමුනුව

ISBN 978-624-206-700-1

කෘතිය පළ කරන දිනය - 2023. 11. 15

**ආකූල රේඛා අනාකූල කළ**

**නොගැලපීම් එකමුතුවක් කළ**

**උච්ච වායුව ඇතුළු මූලද්‍රව්‍ය 42ක් වූ**

**ආදරණීය F ගොනුවට....**

***~vVv***

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි.එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි . එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ අප ගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍යය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී . දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකමක් වටිනාකමක් සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබෙන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යැයි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් කල සැමට හෘදයාංගම ස්තුතියි මෙමගින් පිරිනමමි .

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි .

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10. 20

# පටුන


1) එකොළහෙන් දොළහට

2) උදේ රැස්වීම

3) එක දිගට වැඩ ගොඩක්

4) ලස්සන වාරාවසානයක්

5) Fail නොවන F පන්තිය

# එකොළහෙන් දොළහට

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵලවලින් විශිෂ්ට සාමාර්ථ ලබා ගෙන සිටි මමත් මගේ මිතුරියත් උසස් පෙළ සඳහා සංයුක්ත ගණිත විෂය තෝරා ගත්තේ අපි දෙන්නගෙම ආසාවට. අපි දෙන්නම වැටුනෙත් එකම පන්තියට.

දිවයිනේ ප්‍රධාන පෙලේ බාලිකා පාසලක් වුණු අපේ පාසලේ ප්‍රාථමික අංශය පිහිටලා තිබුණේ වෙනම. ජ්‍යෙෂ්ඨ අංශයේත් 6-11 ශ්‍රේණි එක පසෙකත් උසස් පෙළ අංශය තවත් පසෙකත් පිහිටලා තිබුණා.

උසස් පෙළ පන්තිවලට ආපු මුල් දවසේ අපි දෙන්නට දැනුණේ වෙනම ලෝකයකට ආව වගේ. දවසකට දෙතුන් පාරක් ඉස්කෝලේ පුරාම ඇවිදපු අපි දෙන්නට ඉස්කෝලේ කොනකට හිරවෙලා වගේ දැනුණා. ඊටත් වඩා A 9 පන්තිය... හැමවෙලාවෙම පොතට ඇලිලා ඉන්න ළමයි ගොඩක් තමයි අපි බලාපොරොත්තු වුණේ.

කලින් හිටපු යාලුවන්ගෙන් සමහරු වාණිජ විෂය තෝරා ගනිද්දී සමහරු තෝරා ගත්තේ කලා විෂය. තවත් කිහිප දෙනෙක් විද්‍යා අංශයට ආවත් එයාලා තෝරා ගත්තේ ජීව විද්‍යා විෂය. ඉතින් අපි දෙන්නා විතරයි එතනින් සංයුක්ත ගණිතය තෝරා ගත්තේ .

ඒත් කමක් නෑ. අලුතින් ඔක්කොම පටන් ගන්න ඕනි කියල හිතලා පළවෙනි දවසේ ඉඳලම අපි දෙන්න ඉස්කෝලේ ගියා. ගියාට පස්සේ තමයි හොඳම ටික..

අපි දෙන්නත් එක්ක පන්තියේ ළමයි 42ක්. ඒ අතරේ හඳුනන මුහුණු වගේම කවදාවත් දැකලා නැති මුහුණුත් තිබ්බා.

" ආයුබෝවන් ළමයි " හුරු පුරුදු කටහඬක්. පන්තියට ආපු මිස්ව දැකපු අපිට ටිකක් සතුටු හිතුණා. මිස්ව අපි කලින් දන්නවා. හැබැයි ටිකක් සැරයි.

" මං තමයි ඔයාලගේ ක්ලාස් ටීචර්. සමහර අය මාව දන්නවත් ඇති. ඒ වගේම නොදන්නා අයත් ඇති. මං හොඳට හොඳයි. ඒ වගේම තමයි නරකටත්

නරකයි. " පළවෙනි දවසෙම මිස් අපිට කිව්වා. මෙච්චර කල් හිටපු මිස්ලා නම් අපිත් එක්ක හරි එකතුයි. මිසුත් පස්සේ එහෙම වෙයි. අපිට හිතුවා.

ඔහොම ටික දවසක් ගතවුණා. හැබැයි ඉතින් මිස් නම් වෙනස් වුණේ නෑ. තව ටිකක් සැර වුණ එක තමයි වුණේ. ඔය අතරේ පන්තියෙත් සමහර වෙලාවට පොඩි පොඩි ප්‍රශ්න. හැබැයි ඉතින් ඒවා අවසානයේ යාලුවෝ එක්කෙනා දෙන්නා ඇති වුණේ අපිටත් නොදැනෙන්න.

අපේ පන්ති භාර මිස් අපිට ඉගැන්නුවේ භෞතික විද්‍යාව. සටහන් සම්පූර්ණ නැත්නම් ඉතින් බැනුම් තමයි. සමහර වෙලාවට හිටගෙන ඉන්නත් වුණා. ඉංග්‍රීසි උගන්නපු මිස් නම් ටික ටික අපිත් එක්ක එකතු වුණා. හැබැයි ඉතින් සතියටම ඉංග්‍රීසි තිබ්බේ දවස් දෙකයි. අපි ඒ දවස් දෙක එනකම් බලන් හිටියේ හරි අසාවෙන්. ඒකටත් එක්ක රසායන විද්‍යාව උගන්නපු සර්. මිස්ලගෙනුත් පීරියඩ් ඉල්ලගෙන තමයි අපිට උගන්නන්න ආවේ. එහා කොනේ ඉඳන් මෙහා කොනට යනකම් සර් ප්‍රශ්න අහනවා. කාගෙන් අහයිද දන්නැති හින්දා අපි හැමෝම ඒ වෙලාවට පාඩම අහන ඉන්නේ හරිම අවදානෙන්. අපට සංයුක්ත ගණිතය ඉගැන්නුවේ මිස් කෙනෙක්. ටිකක් නම් සැරයි. හැබැයි හැම වෙලාවේම එහෙම නෑ.

# උදේ රැස්වීම

ඔහොම ඉන්නකොට කාලය ගතවෙනවා දැනුනෙත් නෑ. අපිවත් දන්නේ නැතුව අපිට යාළුවො ගොඩක් එකතු වෙලා. අපේ මිසුත් ටික ටික වෙනස් වෙන්න පටන් අරන්.

ඔය අතරේ තමයි දවසක් උදේම අපේ රැස්වීමක් ගත්තේ. " ලබන සතියේ ඉඳලා හැම සතියෙම බ්‍රහස්පතින්දාට විද්‍යා අංශයේ උදේ රැස්වීමක් තියනවා. A පන්තියෙන් තමයි පටන් ගන්නේ. එදාට ඔයාලට පුළුවන් ඔයාලගේ දක්ෂතා අපි හැමෝම ඉස්සරහ පෙන්වන්න. " අපේ අංශ භාර මිස් එදා ඔහොම කිව්වට අපිට ලොකුවට තේරුනේ නම් නෑ.

ඔන්න ඉතින් A පන්තිය උදේ රැස්වීම කළා. එයාලගේ රැස්වීමේ සින්දුවක්, නැටුමක් වගේම කතාවකුත් තිබුණා. අන්තිමට එයාලගේ පන්ති භාර මිස් හරිම ආඩම්බරයෙන් එයාල ගැන කතා කළා. ඒත් තාමත් අපිට ඒක දැනුණේ නෑ. අපිත් ඉතින් ඔහොම එකක් කරන්න ඕනිනේ කියන අදහස විතරයි අපේ ඔලුවේ තිබුණේ.

සතියෙන් සතිය ගෙවිලා ගියා. B පන්තිය, C පන්තිය කරද්දී තමයි අපිට මේක හරියටම තේරුණේ. D, E ඊළගට F... තව සති දෙකයි අපේ රැස්වීමට. හැමෝම හරි කලබලයෙන් වගේම ගොඩක් උනන්දුවෙන් මේකට ලෑස්ති වුණේ කාටවත් වැඩ අපි වැඩියෙන් හොඳට කරන්න ඕනි කියල හිතාගෙන නම් නෙවෙයි. ඇත්තටම අපිට ඕනි වුණේ අපේ මිස්ගේ මූණ ආඩම්බරයෙන් පිරෙනවා බලන්න.

අන්තිම දවස් වෙද්දී මිස්ලගෙනුයි සර්ලගෙනුයි බැනුම් අහ අහා තමයි අපි පුරුදු වුණේ. ඊටත් වැඩ ගෙවල්වලිනුත් බැනුම්. ඒත් කවුරුත් තමන්ගේ වැඩ අතෑරියේ නම් නෑ. හැබැයි ඉතින් අන්තිම දවස්වල ඒ වැඩවලට ඉංග්‍රීසි පීරියඩ් එකයි, භෞතික විද්‍යාව පීරියඩ් එකයි නම් අනිවරෙන්ම වගේ හම්බුණා. සින්දුවක් එක්ක නැටුමකුත්, කෙටි නාට්‍යකුත් අපේ රැස්වීමට ඇතුලත් වුනා.

අපේ මේ උදේ රැස්වීමට ගොඩාක් උදව් කරපු කෙනෙක් හිටියා. ඒ තමයි අපිට ඉංග්‍රීසි උගන්නපු මිස්. අපි වැඩිපුර ම පුහුණුවීම් කළේ මිස්ගේ පීරියඩ් වල. ඒ හැම වෙලාවේම මිස් අපිත් එක්කම හිටියා. අපේ අඩුපාඩු වෙන තැන්, අපි

හදාගන්න ඕනි තැන් ගොඩක් අපිට කියලා දුන්නේ මිස්. අපේ නාට්‍ය පොඩි වෙලාවක එකක් වුණත් හැමෝටම දැනෙන විදිහට ඒක කරන්න මිස් අපිට ගොඩක් උදව් කළා. අපේ මිස් නැති වෙලාවල් වලදී අඩුවක් නොදැනුණේ මිස් අපිත් එක්ක හිටපු නිසා.

අද තමයි රූස්වීම. හැමෝම එහාට දුවනවා මෙහාට දුවනවා. එක එක්කෙනාට වෙන වෙනම වැඩ පැවරිලා තිබ්බත් හැමෝම හැමදේම ගැන හොයලා බැලුවේ හරිම උනන්දුවෙන්. වෙනදට පරක්කු වෙලා එන කට්ටිය එදා උදෙන්ම ඇවිත්.

ටිකෙන් ටික වෙලාව ලං වුණා. ගාථා කියලා ඉවරයි. " දැන් පටන් ගන්න." කියලා කිව්ව වෙලාවේ නම් හැමෝටම පොඩි බයක් දැනුණා. එදා අපි රූස්වීම පටන් ගත්තේ හරි ලස්සන නැටුමකින්. ඉවර වෙද්දී ආපු ලොකුම ලොකු අත්පුඩි සද්දේ එක කොච්චර ලස්සනද කියල නොකියා කිව්වා වගේම ඊළගට තිබ්බ අංගවලටත් ලොකු ශක්තියක් වුණා. ඔහොම අපේ නාට්‍යත් ඊට පස්සේ තිබ්බ සින්දුවත් ඉවර වෙද්දී අපි හැමෝගෙම හිත ඔක්කොටම වඩා සතුටු වුණේ අපේ මිස්ගේ මූණේ තිබුණු හිනාව දැකලා. අපි නාට්‍ය පුරුදු වුණු හැම වෙලාවේම හිටපු අපේ ඉංග්‍රීසි මිසුත් හයියෙන් හිනා වේවි නාට්‍ය බැලුවේ හරියට පලවෙනි වතාවට බලනවා වගේ. මිස්ලා දෙන්නා කතා කර කර හිනා වේවි බලන් ඉද්දි කොච්චර බැනුම් ඇහුවත් අපේ මහන්සිය අපතේ ගියේ නෑ කියල අපිට හිතුණා.

ගොඩක් පණිවිඩ දෙන්න තිබුණු නිසා අපේ මිස් වෙනුවට එදා රූස්වීමේ කතා කළේ අපේ අංශ භාර මිස්. අපේ සහෝදර පන්තියක පන්ති භාර මිස් කෙනෙක් වෙලත් ඒ මිස් අපේ රූස්වීම වර්ණනා කරපු විදිහට අපේ මිස්ලා දෙන්නා වගේම අනික් සර්ලා මිස්ලා ඔක්කොමත් ගොඩක් සතුටු වෙලා තියෙනවා කියලා අපිට තේරුණා. ඒ හැම වෙලාවකම අපේ මිස්ගේ මූනේ තිබුණේ හරි ආඩම්බරකාර හිනාවක්. අපේ ඉංග්‍රීසි මිසුත් ඒ හිනාව දිහා අපි වගේම බලන් හිටියා. මොකද මිස් දැනන් හිටියා අපි රූස්වීම හොඳටම කරන්න හේතුව අපේ මිස්ගේ මූණේ ඒ හිනාව බලන්න කියලා.අන්තිමට පන්තියට ගියපු අපිට මිස් කියපු වචන ටික අහලා ආපහු උඩ පැනලා නටන්න තරම් සතුටු හිතුනා.

එදායින් පස්සේ අපේ පන්තියේ ලොකු වෙනසක් වුණා. මුලදී පොඩි පොඩි දේවල් වලට රණ්ඩු කරපු අපි පුදුම හිතෙන විදිහට එකතු වුණේ හරියට පවුලක් වගේ. මිස්ලා දෙන්නයි අපි හතලිස් දෙකයි හිටපු ඒ පවුලේ අම්මා වුණේ අපේ මිස්.

## එක දිගට වැඩ ගොඩක්

දින, සති, මාස ගෙවුන නෙවෙයි ඉගිල්ලුනා කිව්වොත් හරි. අපිටත් නොදැනීම උසස් පෙළ පතියට ඇවිත් මාස පහක් විතර ගතවෙලා. රැස්වීමෙන් පස්සේ මිස්ලා, සර්ලා පුළුවන් හැම වෙලාවකම ඉගැන්නුවේ හරියට ඉස්සරහට තවත් උගන්නන්න තියන දවස් අඩුවෙන කාලයක් එන්න යනවා කියලා පෙරනිමිති දැකලා වෙන්න ඇති.

කොහොමත් අප්‍රේල් අවුරුදු මාසෙන් පටන් ගත්තාම වෙසක්, පොසොන්, ඇසළ මේ ඔක්කොම උත්සව මාසනේ.

මාර්තු මාසේ ඉවර වෙන්නත් කලින් ගස්වල අලුත් දළු ලියලලා ලස්සනට මල් පිපෙද්දී කොහාත් කෑගහන්න පටන් ගත්තේ හරියට අවුරුදු මාසේ පිළිගන්න වගේ. අලුතින් තීන්ත ගාලා ගෙවල් දිස්නේ දෙද්දී පරිසරය අතු ඉතිඅල බරටම එල්ලෙන පලතුරුවලිනුයි, අතු අස්සේ හැංගිලා හිටපු පුංචි පුංචි මල්වලිනුයි දිස්නේ දුන්නා.

අවුරුදු කිහිපයකට පස්සේ හැමෝම සතුටින් අලුත් අවුරුද්ද පිළිගන්න ලෑස්ති වෙද්දී පාසල්වලත් අවුරුදු උත්සව පැවැත්වුනේ අපි හැමෝටම ඒ අත්දැකීම ආපසු අලුත් විදිහට ලබා ගන්න අවස්ථාවක් ලබා දෙමින්.අනෙක් පාසල්වල වගේම අපේ පාසලෙත් උසස්පෙළ අංශය සඳහා ජන ක්‍රීඩා රැසකින් සමන්විත වුණු අවුරුදු උත්සවයක් පැවැත්වුනා. කණාමුට්ටි බිඳීම, ගෝනි රේස්, අන්ධයාට කිරි කැවීම, බැලුන් පිපිරවීම, අවුරුදු කුමරිය වගේ තරග රැසක් ඇතුලත්වුන අවුරුදු උත්සවය අපි හැමෝගෙම හිත සතුටින් පිරෙව්වා.

අවුරුදු නිවාඩුවෙන් පස්සේ ඉස්කෝලෙට එනකොට ඒ මාසේ ඉවර වෙලා වෙසක් මාසේ පටන්ගන්න හැමෝම සූදානම් වෙනවා. හැමතැනින්ම ඇහුණු රතිඤ්ඤා සද්දේ නැවතිලා ගිහින් කොහෝ හඬත් සුළඟට මුසුවෙද්දී මුළු පරිසරයම ශාන්ත බවකින් වෙළුණේ බුදු තෙමඟුල සිහි කරන්න හැමෝගෙම සිත් ශ්‍රද්ධාවෙන් පුරවන්න වගෙයි.

මෙවර පාසල් වෙසක් සතිය තුල අපට කැමති ඕනෑම විදිහකට වෙසක් කූඩුවක් හදන්න අවසර ලැබිල තිබුණා. හැමදාම අලුත් වෙනස් දෙයක් කරන්න හිතන අපේ කට්ටියට නම් අදහස් ගොඩයි. හැබැයි හදන්න තමයි අමාරු.

අටපට්ටම්, තරු, නෙලුම් මල් වගේ හැමතැනම දකින්න හම්බවෙන විදිහේ වෙසක් කූඩුවක් හදන්න කාටවත් අදහසක් නම් තිබුනේ නෑ. ඉතින් අපි ඒ දවස් ටිකේ ම " මිස්, අපි මෙහෙම හදන්නද? ", " මිස්, අපි අර වගේ හැදුවට කමක් නැද්ද? " කියලා මිස්ගෙන් අහද්දී ඒ හැම වෙලාවේම මිස් නම් කිව්වේ එක දෙයි. " ඔයාලා කැමති විදිහේ කූඩුවක් හදන්න. හැබැයි මේ දොරෙන් එළියට ගන්න පුළුවන් විදිහේ එකක් හදන්න. හරිද " මිස් අපේ හැටි දන්න හින්දම තමයි එහෙම කිව්වේ. අපිට කැමති විදිහට ලස්සන වෙසක් කූඩුවක් හදන්න මිස් අපිට නිදහස දුන්නා වගේම ගොඩක් උදව් කළා.

එක එක විදිහේ වෙසක් කූඩු ගැන හිතපු අපි අන්තිමට නතර වුණේ රොකට් එකක් ළඟ. ටිකක් අමාරු වුණත් පන්තියේ හැමෝගෙම සහයෝගය ලැබුණු නිසා අපිට එක එච්චරටම අමාරු වුණේ නෑ. සමහරු උණබට කපනවා, සමහරු රැළි කපනවා, සමහරු කූඩුවේ සැකිල්ල හදනවා, තවත් සමහරු අලවනවා. ඔහොම වැඩ බෙදාගෙන කරපු නිසා අපිට ගොඩක් ලස්සනට අපේ රොකට් එකේ වැඩ අවසන් කරන්න පුළුවන් වුණා. හැමෝටම පේන්න සර් අපේ කූඩුව එල්ලද්දී එදා අපි හරි ආසාවෙන් බලන් හිටියා.

වෙසක් මාසේ ඉවර වෙනකොට පටන් ගත්ත පොසොන් මාසේ තවත් ආගමික උත්සවයක් තිබුණු මාසයක්. පොසොන් පෝය නිමිති කරගෙන අපේ පාසලෙත් පාසලේ භක්තිගීත වැඩසටහනක් පැවැත්වුණා. මුලින්ම පහල ශ්‍රේණිවල නංගිලාට විතරක් සංවිධානය කරලා තිබුණු මේ වැඩසටහනට උසස් පෙළ අංශයත් සහභාගී කරවන්න හදිසියේම තීරණය කරලා තිබුණා. භක්තිගීත වැඩසටහන පවත්වන්න කලින් දවසේ අපේ විද්‍යා අංශයේම අක්කලා ඇවිත් සින්දු කියන්න පුළුවන් අයව එක්කන් ගියේ වැඩි විස්තර නම් මොකුත් කියන්නේ නැතිව. " නංගිලා හෙට භක්තිගීත කියන්න ඔයාලා සුදු ඔසරියක් අඳින්න ඕන. හැමෝම හොයාගන්න කොහොමහරි." අක්කලා එහෙම කියද්දී එතන හිටපු ගොඩක් අය අකමැති වුණා සාරි හොයාගන්න බෑ කියල. ඒ වුනත් ඒ තීරණේ නම් වෙනසක් වුණේ නෑ.

එදා හවස අපි ගෙදර යනකොට භක්තිගීත කියන්න හිටපු නැති යාළුවො ඔක්කොම එකතු වෙලා දන්නා අඳුරන හැමෝටම කියලා කොහොම හරි අපිට සාරි හොයලත් ඉවරයි. පහුවදා උදෙන්ම ඇවිත් අපිට සරි අඳින්න උදව් කලෙත්

එයාලා ම තමයි. එක තැනක ගොඩක් වෙලා එක විදිහකට ඉන්න බැරි අය තමයි අපේ පන්තියේ ගොඩක්ම හිටියේ. සාරි ඇඳගෙන එහාට දුවනවා, මෙහාට දුවනවා. අන්තිමට සාරි අන්දවපු අයම ඇවිත් බැනලා මොකුත් උනොත් ආපහු අන්දවන්නේ නෑ කියලා තර්ජනය කරාට පස්සේ තමයි අපි එක තැනකට වෙලා හිටියේ. ඉස්කෝලේ වත්තේ තිබුණු අරලිය ගහෙන් මල් කඩලා ගෙනත් අපේ කොණ්ඩ වල ගහලා, ලස්සන වතුසුද්ද මල්වැල් ගොතල දීලා අපි භක්තිගීත කියද්දී එයාලා අපිට උදව් කරපු අක්කලාත් එක්ක ආසාවෙන් බලන් හිටියා. භක්තිගීත ඉවර වෙද්දී ආපු ලොකුම ලොකු අත්පුඩි සද්දේ මුළු විද්‍යා අංශයම සතුටු කරා කිව්වොත් හරියටම හරි.

## ලස්සන වාරාවසානයක්

දෙවෙනි වාරය අවසන් වෙන්න කලින් පැවැත්වුණු වාර විභාගයේ අවසන් දවස. මීට සතියකට විතර කලින් තමයි අපට වාර විභාගය පටන් ගත්තේ. අපිත් එක්ක ම 13 වසරේ අක්කලාටත් වාර විභාගය පැවැත්වුණු නිසා අපට විභාගය අතරමැද නිවාඩු දවස් කිහිපයක් ම හම්බවුණා.

අපට විභාගය පටන් ගත්තේ රසායන විද්‍යාව ප්‍රශ්න පත්‍රයෙන්. ඒ විෂයේ ප්‍රශ්න පත්‍ර දෙක ඉවර වෙනකොට අපිට හැමදේම රසායනය වෙන්න පටන් අරන් වගේ තිබුණේ. ඒ නිසාමදෝ මන්දා දවස් දෙකක නිවාඩුවක් අපිට හම්බවුණේ. සෘණ, ධන මාරු වෙන්නේ නැතුව සංයුක්ත ගණිත ප්‍රශ්න පත්‍රයට මුහුණ දෙන්න ඒ දවස් දෙක අපට උදව් වෙයි කියල අපිට හිතුණා.

එත් ඉතින් වැඩි වෙනසක් නම් නෑ. ප්‍රශ්න පත්‍රයට ඒවි කියල බලන් ගියපු ප්‍රශ්න අනික් පැත්තට අහලා තියෙද්දී අපෙත් උතුර දකුණ මාරුවෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ. එදානම් මාපාංකත් සෘණ නොවී තියාගන්න සැහෙන්න මහන්සි වෙන්න වුණා.

" තව දවස් දෙකයිනේ. ඊට පස්සේ ඉවරයි." ප්‍රශ්න පත්‍ර අමාරු වුණු හැම වෙලාවකම අපි හිත හදාගත්තේ ඔහොම හිතලා.

ඊළගට දෙන්න තිබුණු භෞතික විද්‍යාව ප්‍රශ්න පත්‍රයෙයි, ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයෙයි දවස් මාරු වුණේ සතුටු වෙන්නද, දුක් වෙන්නද කියන තැන අපටත් ප්‍රශ්නාර්ථයක් ඉතිරි කරලා.

මොනා වුනත් අපි හොඳට ම ලිව්වේ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය තමයි. කොච්චර හොඳට ලිව්වද කියනවා නම් සමහර ප්‍රශ්නවලට උත්තර අපි හොයා ගත්තේ ප්‍රශ්නවලින් ම යි. දවස් ගාණක් කතා කරන්න, හිනාවෙන්න ජාති ගොඩක් අපි එක එක්කෙනාගේ ප්‍රශ්න පත්‍ර බැලුවාම මිස්ට හිතෙන්න ඇති.

අද තමයි දෙවෙනි වාර විභාගයේ අන්තිම දවස. නිවාඩු හම්බෙන දවස. ඒ දවසේ තවත් ලොකු විශේෂත්වයක් තිබුණා. හැබැයි ඒ එදා තිබුණු ප්‍රශ්න පත්‍රය නම් නෙවෙයි.

උදේ ඉඳන් අපි හැමෝම හිටියේ විභාග මානසිකත්වයෙන්. එදා ප්‍රශ්න පත්‍රය කලින් ඒවාට වැඩ ටිකක් අමාරු හින්දා වෙන්න ඇති ගොඩක් දෙනෙක්ගේ මූණුවල නම් ලොකු සතුටක් තිබුනේ නෑ විභාගය ඉවර වෙද්දී. විභාගය ඉවර වෙලා හැමෝම තැන තැන දූක කියනවා යාලුවන්ට. යාලුවෝ අහන් ඉන්නවා. ඉස්කෝලේ ඉවර වෙන්න විනාඩි පහළොවක් විතර තියලා ඔන්න නිවේදනයක්.

" අද දින පැවැත්වෙන සුහද ක්‍රිකට් තරගය නැරඹීම සඳහා එක්වන දියණිවරුන් දැන් මහජන ක්‍රීඩාංගනයට පිටත් වන්න." ඒක ඇහුණු ගමන් අර තැන තැන දූක බෙදා ගත්ත යාලුවෝ කොහෙද කියලා හොයා ගන්න නෑ. හැමෝම හරි කලබලෙන් යන්න ලෑස්ති වුණා. ඒ අපි ආසාවෙන් බලාගෙන හිටපු තවත් අවස්ථාවක්. පාසලට වගේම අපිටත් විශේෂ අවස්ථාවක්. අපේ පාසලේත්, අපේ නගරයේ අනෙක් බාලිකා පාසලේත් ගුරුවරුන්ගේ සුහද ක්‍රිකට් තරගය.

එදා අපේ පන්තියේ හැමෝම වගේ ක්‍රිකට් තරඟය බලන්න ගියා. වෙනදා වගේම හැමෝම වැඩ බෙදාගත්තේ කාගෙවත් බල කිරීමකට නෙවෙයි. එක කොටසක් හැමෝටම ඉඩ අල්ලන්න යද්දී තවත් කොටසක් කෑම බීම අරගෙන එන්න ගියා. තවත් කොටසක් පාසලේ නතර වුණේ කොඩි ටිකක් හදා ගන්න. කොහේදෝ තිබුණු බැලුම් බෝල ටිකකුත් හොයා ගත්තා.

අපි ක්‍රීඩාංගනයට යනකොට මුලු ක්‍රීඩාංගනයම කොළ පාටින් සහ නිල් පාටින් පිරිලා. ඉතින් කොල පාට අපිත් වාඩි වෙන්න තැනක් හෙවුවත් ගොඩක් වෙලා යනකම් ඉන්න තැනක් හම්බුනේ නෑ. හැබැයි ගියපු ඔක්කොම හිටියේ එක ළඟ වගේ. ඉතින් ආයේ ඉඳගෙන බලන්න තැනක් මොකටද?

තරඟය පටන් අරන් ටික වෙලාවක් යනකොට අපි හැමෝටම ඉන්න පුලුවන් තැනක් හම්බවුණා. එතන අපි හැමෝටම නිදහසේ ඇති තරම් කෑ ගහන්න, නටන්න පුළුවන් වුණේ එතන වැඩි දෙනෙක් හිටපු නැති නිසා. ටික වෙලාවක් යනකොට අපේ මිසුත් ආව අපිත් එක්ක කතා කරලා යන්න. අපිත් එක්ක ටික වෙලාවක් කතා කරලා අනික් ගුරුවරු හිටපු තැනට අපේ මිස් ගියා. ටික ටික හවස් වෙද්දී තරඟ උණුසුමත් වැඩිවුණා.හැමෝම කෑ ගහනවා.කෑ ගහලා කෑ ගහලා අන්තිමට කථා කරගන්න බැරි තරම්.

උදේ ඉඳන් තිබුණු පීඩනය අපෙන් අයින් වෙලා යද්දී ඒ සතුට දෙගුණ තෙගුණ වුණේ අපේ ඉස්කෝලේ සර්ලා ක්‍රිකට් තරඟය දිනපු නිසා. තරඟය දිනනවත් එක්කම අපි හැමෝම පිට්ටනිය මැද්දට දිව්වේ අපේ සතුට පෙන්වන්න. කුසලානයත් අරන් පිට්ටනිය වටේම දුවලා, හති වැටෙනකම් නටලා අපි එදා ගෙවල්වලට එද්දී රෑ වෙන්නත් ළඟයි. අව්ව, රස්නේ නිසා කොච්චර අමාරුවෙන් හිටියත් අපි එදා ගොඩාක් සතුටු වුණා. එදා වුණු හැම දෙයක්ම අපේ මතක පොත්වලට එකතු කළේ අමුතු ලස්සනක්.

# Fail නොවන F පන්තිය

තත්පර කටුව වේගයෙන් කැරකිලා මිනිත්තු කටුවට දුන්න බලය පැය කටුවට දෙගුණ තෙගුණ වෙලා ලැබුණු හින්දා වෙන්න ඇති කාලය ගතවුණේ හරිම වේගයෙන්. ඒ වුනත් කාලයත් එක්ක ගලාගෙන ගිය අපේ ජීවිත නම් පොඩ්ඩක්වත් ඒකාකාර වුණේ නෑ. දින සති මාස ගෙවිලා උසස්පෙළ විභාගය ලංවෙද්දි පාසල් යන එක අඩු වුණත් අපි හැමෝම හම්බවුණු හැම තැනම සිනා සාගරයක් වුණේ නිරායාසයෙන්. අපි හැමෝම මෙහෙම එකට එකතු වෙලා ඉද්දි වැඩිපුරම සතුටු වුනේ අපේ මිස්.

"ඔයාලා ඔක්කොම මෙහෙම එකතු වෙලා සහයෝගයෙන් ඉන්නවා වගේම ඔයාලා හැමෝගෙන්ම හොඳ ප්‍රතිඵල මං බලාපොරොත්තු වෙනවා." ඉඳලා හිටලා හරි ඔහොම මතක් කරන්න අපේ මිස්ට නම් අමතක වුනේ නෑ.

ටිකෙන් ටික උසස්පෙළ විභාගය ලං වුණා. ඒ වෙද්දි හැමෝම ගොඩක් මහන්සි වෙලා වැඩ කළේ ඊට ටික කාලෙකට කලින් හැමෝම හැමෝටම දුන්න පොරොන්දුව රකින්න.

ඒ කාලේ සමහර වෙලාවට අපිට ප්‍රශ්න ආවේ පන්තියක් විදිහට. ඒ වගේ තැන වලදී පන්තියක් විදිහට අපි හැමෝටම එකතු වෙලා ඒ ප්‍රශ්න වලට මුහුණ දෙන්න අමාරු වුණේ නෑ. එත් සමහර ප්‍රශ්න ආවේ පන්තියේ ළමයින්ට. එදත් එහෙම දවසක්.

කවුද හරි කවුද වැරදි කියල තේරුම් ගන්න ගොඩක් වෙලාව ගතවුණු ප්‍රශ්නයක්. ගොඩක් අය එදා හරියටම වු ණු දේ වත් දන්නේ නැතුව එයාට චෝදනා කරද්දී අපේ පන්තියේ හැමෝම එයා වටේට හිටගත්තේ දෙපාරක් හිතන්නේ නැතුව. ප්‍රශ්න දුර දිග ගෙනියන්න ඕනි න කියල හිතල අපි නොකියා හිටපු සමහර දේවල් එදා චෝදනා කරපු අය ම හොයාගෙන වැරැද්ද වුණේ කොතනද කියලා තේරුම් ගනිද්දී ගොඩක්ම පසුතැවුනේ එයාලා. එත් ඒ වෙනකොට අපි හැමෝගෙම හිත ගොඩක් රිදිලා ඉවරයි.

ඇත්තටම එදා හරි පුදුම දවසක්. එදා අපි ඇඩුවා. අඬපු අය සනසන්න සමහරු එයාලගේ කඳුලු තදකරගෙන අමාරුවෙන් හිටියා. අන්තිමට ඒ හැමදේම අමතක කරලා අපි හිනාවුණා. මොකද අපි දුක්වෙද්දී අපි හැමෝගෙම

අම්මත් දුක් වෙනවා අපිට බලන් ඉන්න බැරි වුණ හින්දා. එදා අපි හැමෝම අපිටම පොරොන්දුවක් දුන්නා. ඒ අපේ අම්මලා තාත්තලාට වගේම අපේ ආදරණීය මිස්ට අපිට දෙන්න පුළුවන් ලොකුම තෑග්ග දෙන්න, උසස්පෙළ විභාගය හොඳින් සමත් වෙන්න එදා අපි අපිටම පොරොන්දු වුණා.

එදා ඉඳලා අපි හැමෝම එකතු වෙලා වැඩ කළා. පාඩම් කළා. නොදන්නා දේවල් දන්නා යාලුවන්ගෙන් අහගත්තා. හැමෝම ෆේල් පන්තිය කිය කියා විහිලු කරද්දී නෑ අපි ෆේල් නැති පන්තිය වෙනවා කියන තැනට ස්ථාවරයක් ගොඩනගා ගත්තා.

අන්තිමට අපි හැමෝගෙම බලාපොරොත්තු ඉෂ්ට වුනා. අපි හැමෝම උසස්පෙළ හොඳින් සමත් වුනා. එදාත් අපි ගැන වැඩිපුරම සතුටු වුනේ ඒ ෆේල් නොවන F පන්තියේ ආදරණීය අයිතිකාරියම තමයි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ, ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන්ය. පාසල තුළ ගොඩනැඟී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන තරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි .

දිවිය දිනන පිරිත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකේ දිනන ගත්කතුවරයකු වීමට ශක්තියක් ලැබේවායි පතමු.

මෙයට<br>
සෙනවිරත්න මහලේකම්<br>
පාසක් දරුවන්ට ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ<br>
2023.10. 20